# දිස්ත්‍රික් ලේකම් කාර්යාලය- කොළඹ

---

**කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

## 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

දිළිඳුකම අඩුකිරීම සඳහා වන මූලපිරීම, මැතිවරණ සම්බන්ධීකරණය,සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා අධීක්ෂණය, ආපදා සහන ව්‍යාපෘතීන් හා පුනරුත්ථාපන ව්‍යාපෘතීන් පරිපාලනය, දිස්ත්‍රික් ව්‍යාපෘතීන් පරිපාලනය හා මග පෙන්වීම හා ආදායම් එකතු කිරීම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් වේ.

## 2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

කොළඹ,රත්මලාන, දෙහිවල,පාදුක්ක, තිඹිරිගස්යාය,කොලොන්නාව,කඩුවෙල,ශ්‍රී ජයවර්ධනපුර මහරගම,මොරටුව, කැස්බෑව, හෝමාගම හා හංවැල්ල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල.

## 3. වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම ගිණුම් වර්ෂයේ ආරම්භයේ පිළියෙල කර නොතිබුණි.

## 4. ගිණුම්

### 4.1 මුළු ප්‍රතිපාදනය හා වියදම

කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ඒ යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයම රු.528,575,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු 514,425,594 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ශුද්ධ ඉතිරි කිරීම් රු. 14,149,406 ක් වූ අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් 2.6% ක විය. විස්තර පහත දැක්වේ.

| වියදම් වර්ගය | ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | සියළු ගැලපීම් කිරීමෙන් පසු ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | රු. | රු | රු. | රු | % |
| පුනරාවර්ථන | 401,075,000 | 401,075,000 | 389,543,835 | 11,531,165 | 2.87 |
| මූලධන | 97,500,000 | 127,500,000 | 124,881,759 | 2,618,241 | 2.05 |
| | 498,575,000 | 528,575,000 | 514,425,594 | 14,149,406 | 2.67 |

## 4.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විවිධ කාර්යයන් සදහා වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු පහත සදහන් පරිදි එකතුව රු 4,352,169,612 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර ඒවා උපයෝජනය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විෂය | ප්‍රතිපාදනය ලබාදුන් අමාත්‍යාංශය දෙපාර්තමේන්තුව/ | ලබා දුන් ප්‍රතිපාදන | තථ්‍ය වියදම | ඉතිරිය/අතිරික්තය 2010 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| 101 | බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 525,000 | 450,000 | 75,000 |
| 105 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 560,315,827 | 469,615,967 | 90,699,860 |
| 106 | ආපදා කළමණාකරණ අමාත්‍යාංශය | 83,468,340 | 37,711,423 | 45,756,917 |
| 110 | අධිකරණ අමාත්‍යාංශය | 2,217,216 | 1,763,161 | 454,055 |
| 117 | මහා මාර්ග අමාත්‍යාංශය | 10,000 | 49,998 | (39,998) |
| 118 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 147,000 | 57,000 | 90,000 |
| 120 | ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය | 7,401,362 | 5,558,068 | 1,843,294 |
| 121 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 8,088,901 | 21,102,644 | (13,013,743) |
| 124 | සමාජ සේවා අමාත්‍යාංශය | 9,609,296 | 6,426,751 | 3,182,545 |
| 127 | කම්කරු සබඳතා සහ ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය | 255,000 | 196,250 | 58,750 |
| 133 | තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 6,776,157 | 5,868,129 | 908,028 |
| 134 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 88,150 | 88,150 | -- |
| 142 | ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු | 461,755 | 818,172 | (356,417) |

| | | | | |
|---|---|---|---|---|
| | අමාත්‍යාංශය | | | |
| 145 | නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 4,943,236 | 4,306,972 | 636,264 |
| 153 | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 185,165,863 | 171,675,261 | 13,490,602 |
| 156 | යෞවන කටයුතු අමාත්‍යාංශය | 434,550 | 397,307 | 37,243 |
| 160 | පරිසර අමාත්‍යාංශය | 800,000 | -- | 800,000 |
| 201 | බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව | 7,121,020 | 6,839,259 | 281,761 |
| 203 | ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුව | 2,000,000 | 1,000,000 | 1,000,000 |
| 204 | හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 400,000 | 241,384 | 158,616 |
| 206 | සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව | 309,966 | 306,606 | 3,360 |
| 210 | ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව | 8,000 | 6,160 | 1,840 |
| 216 | සමාජ සේවා දෙපාර්තමේන්තුව | 6,763,023 | 6,327,054 | 435,969 |
| 217 | පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව | 4,888,569 | 4,365,315 | 523,254 |
| 218 | සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 321,801,469 | 286,400,066 | 35,401,403 |
| 219 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 911,864 | 382,367 | 529,497 |
| 227 | පද්ගලයන් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 24,090 | 17,256 | 6,834 |
| 252 | ජන ලේඛන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව | 4,550,422 | 2,759,063 | 1,791,359 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 3,125,138,253 | 2,956,383,268 | 168,754,985 |
| 254 | රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව | 7,545,283 | 6,144,056 | 1,401,227 |
| | | 4,352,169,612 | 3,997,257,107 | 354,912,505 |

## 4.3 විගණනය හා විගණන විෂය පථය

කොළඹ .උස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම/ගිණුම්* ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ වාර්තාව 2011 අගෝස්තු 30 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ

ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 4.4 ගිණුම් හා සැසදුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසදුම් ප්‍රකාශ පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 4.5 ගිණුම් හා සැසදුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසදුම් ප්‍රකාශවල තත්ත්වය මෙහි (අ) සහ (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 4.7 සිට 4.9 දක්වා වූ ඡේදවල ඇතුලත් වෙනත් ප්‍රධාන විගණන සොයා ගැනීම් වල ප්‍රකාශ වන, පරිදි සතුටුදායක ලෙස පිලියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ගිණුම් ඉදිරිපත් කිරීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2011 මාර්තු 31 දිනට පහත සඳහන් ගිණුම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ශීර්ෂය | ගිණුමේ නම |
|---|---|
| 255 | විසර්ජන ගිණුම |

### (ආ) අයවැය විචලනය

වැය විෂයයන් 17 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් 5 % ත් 88% අතර පරාසයක වූ ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**

-------------

2011 අප්‍රේල් 30 දින වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පියවා නොතිබුණු අග්‍රිම ශේෂවල එකතුව රු.30,000 ක් වී තිබුණි.

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------

විෂය අංක 25501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ 2010 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාර, එම දින වන විට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.8,018,854 ක්වූ අතර, එම ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

**4.6 පාඩු හා හානි**

----------------

රු.263, 469 කට ඇස්තමේන්තු කර තිබු වාහන අනතුරු 08 ක් , වත්කම් හානිවීම් 1 ක් හා නැතිවීම් 02 ක් සම්බන්ධයෙන් මු.රෙ.104, ප්‍රකාරව 2011 ජුනි 30 වන විටත් කටයුතු කර නොතිබුණි.

4,7 **<u>අනාර්ථික ගණුදෙනු</u>**

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව ආයතනයට වාසිදායක නොවන අන්දමින් එළඹ තිබුණු ගනුදෙනු අතර පහත අවසථා උදාහරණ වශයෙන් දැක්විය හැකිය.

(අ.) බස්නාහිර පළාත් සභාවේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් ( ඉංජිනේරු ) ගේ අංක 41718 (2009) හා 2009 මාර්තු 02 දිනැති ගොඩනැගිලි/මාර්ග/වාරිමාර්ග ගාස්තු ලේඛණයේ සී.05 කොන්ක්‍රීට් මිශ්‍රණය වෙනුවට උපලේඛනයේ සී 06 කොන්ක්‍රීට් මිශ්‍රණය යොදා ගැනීම හේතුවෙන් මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කර්මාන්ත 10 ක් සම්බන්ධයෙන් කොන්ක්‍රීට් කියුබ් 145.25 ක් සඳහා රු.746,581 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ.) මහරගම නගර සභාව විසින් ඉටුකර තිබූ පිරිවැය රු.1,040,679 ක් වූ මාර්ග ව්‍යාපෘති 5 ක් භෞතිකව පරීක්ෂා කිරීමේදී එකී මාර්ග ව්‍යාපෘති 4 ක දිග පළල සහ ඝණකම (උස) මිනුම් වාර්තාවල සඳහන් වූ ප්‍රමාණයට වඩා අඩුවෙන් තිබීම මත කොන්ක්‍රීට් කියුබ් 2.88 ක් වෙනුවෙන් රු.91,465 ක වැඩිපුර ගෙවීමක් නිරීක්ෂණය විය.

4.8. **<u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>**

නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ මෙහෙයුම් අකාර්යක්ෂමතා සම්බන්ධව සාරාංශයන් පහත දැක්වේ.

(ඇ.) ජාතික සවිය මග නැගුම සහ විමධ්‍යගත අයවැය සංවර්ධන වැඩ සටහන යටතේ ව්‍යාපෘති 24ක් ක්‍රියාත්මක කිරීම සඳහා රු.6,269,332 ක ප්‍රතිපාදන මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මහරගම නගර සභාව වෙත නිදහස් කර තිබුණද එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ ගෙවීම් වල නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා කිසිදු අධීක්ෂණයක් / පසුවිපරමක් මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදුකර නොතිබුණි.

(ආ.) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006 හි 5.4.6 පරිච්ඡේදයේ සඳහන් පරිදි උක්ත ඉදිකිරීම්වලට අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රඳවා ගත යුතු රු.626,933 ක් එකී වැඩවලට අදාල දෝෂ වගකීම් කාල සීමාව ඉක්මවීමට පෙර මහරගම නගර සභාව වෙත නිදහස් කර තිබුණි.

## 4.9 මානව සම්පත් කළමනාකරණය

(අ) **අනුමත සේවක සංඛ්‍යාව හා පරප්පාඩු**

2010 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 01 | 01 | -- |
| (ii) තෘතික මට්ටම | 82 | 72 | 10 |
| (iii) ද්විතික මට්ටම | 666 | 562 | 104 |
| (iv) ප්‍රාථමික මට්ටම | 133 | 116 | 17 |
| (v) වෙනත් (ග්‍රාම නිළධාරි හා රෙජිස්ට්‍රාර් | 562 | 506 | 56 |
| එකතුව | 1444 | 1257 | 187 |